කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

අධ්‍යාපන පීඨය

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (නාට්‍ය හා රංග කලාව) සතිඅන්ත
පළමු සෙමෙස්තර පරීක්ෂණය - 2016

නාට්‍ය හා රංග කලාව I

පැය තුනයි (03)

ඕනෑම ප්‍රශ්න පහක් (05)- සඳහා පිළිතුරු සපයන්න

---

1. i) කලාව සහ ශිල්පය යන ප්‍රභේදවල සංකල්පීය විකාශය කෙටියෙන් විමසන්න.

(ලකුණු 10)

ii) එම සංකල්ප පසුබිමේ නූතන නාට්‍ය හා රංග කලාවේ විශේෂ ලක්ෂණ ඔබ හඳුනා ගන්නා අයුරු නිදර්ශන සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

2. i) කලාවේ සමාජ කාර්යභාරය ඔබ හඳුනා ගන්නේ කෙසේද? (ලකුණු 08)

ii) තීව්‍ර සමාජ ගැටුම් සහිත අයදාතන ශ්‍රී ලාංකික සමාජය තුළ සාමය සහ සමාජ අනුකලනය උදෙසා වඩාත් සාධනීය මැදිහත් වීමක් කලාවෙන් අපේක්ෂා කළ යුතු වුවත් එවැනි ධනාත්මක තත්වයක් දකින්නට නොලැබෙන්නේ ඇයි? යන ප්‍රහේලිකාව ඔබ විසඳන්නේ කෙසේද? (ලකුණු 12)

3. i) නාට්‍ය වර්ගීකරණය පිළිබඳව ඓතිහාසිකව මුණ ගැසෙන විවිධ ප්‍රවේශ පිළිබඳ සමාලෝචනයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

ii) නාට්‍ය කථා වින්‍යාසය වර්ගීකරණය කිරීම සඳහා ඔබ දන්නා වඩාත් ප්‍රශස්ත වර්ගීකරණ ක්‍රමය කරුණු විමසමින් හඳුන්වා දෙන්න. (ලකුණු 10)

4. සෞන්දර්ය ප්‍රපංචය මනෝ-මූලිකද නොඑසේනම් විෂය මූලිකද යන ඓතිහාසික විවාදය ගැන අර්ධ-ශාස්ත්‍රීය සඟරාවකට යැවිය යුතු රචනාවක් සඳහා දළ කෙටුම්පතක් සකසන්න.

(ලකුණු 10)

5. i) නාට්‍යයක 'චරිතය' යන කේන්ද්‍රීය සංරචකය ඔබ දකින්නේ කෙසේද?

(ලකුණු 10)

ii) යතාර්ථවාදී නාට්‍ය කෘතියක හමුවන 'චරිත' ඇගයීම සඳහා යොදා ගත හැකි විවිධ නිර්ණායක සහ ප්‍රවේශ උදාහරණ සහිතව විමසන්න (ලකුණු 10)

6. i) ඇරිස්ටෝටල්ගේ භාව විශෝධන **(katharsis)** සංකල්පය පිළිබඳ විචාරාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 10)

ii) ඇරිස්ටෝටල් 'කාව්‍ය ශාස්ත්‍රය' සමඟ භරතමුනිගේ 'නාට්‍ය ශාස්ත්‍රය' සන්සන්දනය කරන්න. (ලකුණු 10)

7. i) ප්ලේටෝ කාව්‍ය විරෝධියෙක්ද? විමසන්න. (ලකුණු 10)

ii) ඇරිස්ටෝටල්ගේ 'ට්‍රැජඩි' සංකල්පය පිළබඳ පසුකාලීන විචාරකයන් ඉදිරිපත් කල මතවාද ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

8. i) භරතමුනිගේ 'රස සූත්‍රය' විචාරය කරන්න. (ලකුණු 10)

ii) අලංකාර වාදය පිළිබඳ විචාරකයන් ඉදිරිපත් කල මතවාද විමසීමට ලක්කරන්න.

(ලකුණු 10)